රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | HD/H/COMMON/2023 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2024.01.05 |

ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

**<u>කොළඹ 05, කැප්පෙට්ටිපොල මාවතේ සමුළු නිවාස සංකීර්ණයේ වත්මන් තත්ත්ව වාර්තාව සම්බන්ධයෙනි</u>**

කොළඹ 05, සමුළු නිවාස සංකීර්ණය සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙතින් 2023.09.03 දිනැතිව ලබාදී ඇති තත්ත්ව වාර්තාව අනුව පොදුවේ මෙම නිවාස වල පහත සඳහන් අළුත්වැඩියාවන් සිදුකළ යුතු බව අවධාරණය කර ඇත.

1. බොහොමයක් නිවාසයන්හි පඩිපෙළ අළුත්වැඩියාව (කඩා ඉවත්කර අළුතින් සකස් කිරිම)
2. පැන්ට්‍රි බිත්ති පළුදු වී තිබීම
3. නිවාසයන්හි වැහිපීලි, වහළ දිරාපත් වී කැඩී ඇති බවත්, වහළයන්හි බාල්ක තබා ඇති බිත්ති ඉරිතැලීම ඒ ආසන්න කොන්ක්‍රීට් වහලයන් කැඩී පළුදුව තිබීම
4. මෙම නිවාසවල බොහෝමයක් Bathroom අළුත්වැඩියා කළ යුතු බවත්, ජලනල කැඩී වතුර කාන්දුවීම හේතුවෙන් බිත්ති පළුදුව ගොස් තිබීම
5. නිවාසයන් හී දොර ජනේල කැඩී දිරාපත් ව ඇති බවත්,
6. කොන්ක්‍රීට් තල මත (Slab) තැනින් තැන කැඩී කම්බි මතුව ඇති බවත්, වතුර කාන්දුවීම හේතුවෙන් දිරාපත්ව ඇති බවත්, කොන්ක්‍රීට් කණු අළුත්වැඩියා කළයුතු බව ද දන්වා ඇත.

02. ඒ අනුව, රජයේ නිලධාරින්ගේ පදිංචිය සඳහා වෙන්කර ඇති මෙම නිවාස සංකීර්ණයේ පවතින ඉහත අළුත්වැඩියාවන් පිළිබඳ විශේෂ අවධානයක් යොමුකල යුතුව ඇත. ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව අනුව මෙම නිවාසයන්හී පදිංචිව සිටීම අනතුරුදායක බව හා යම්කිසි අවස්ථාවක අනපේක්ෂිත ව්‍යසන තත්ත්වයක් ඇති වුවහොත් ජීවිත හා දේපල හානි සිදුවීමට බොහෝ ඉඩකඩ ඇති බව නිරීක්ෂණය වේ.

03. එකී වාර්තාවට අනුව මෙම සියලු අලුත්වැඩියාවන් හැකි ඉක්මනින් සිදුකල යුතු වුවත්, මෙම නිවාස ඉවත්කර නව නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට, දශක දෙකක කාලයක සිට පැවත එන උත්සහය හේතුවෙන් නිසි පරිදි අලුත්වැඩියාවන් සඳහා කටයුතු කිරීමට හැකියාවක් ලැබී නොමැත.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2696211-13<br>011-2166000 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2695279 | ඊ-මේල්<br>மின்னஞ்சல்<br>E-mail | info@pubad.gov.lk | වෙබ් අඩවිය<br>இணையத்தளம் | www.pubad.gov.lk |

04. එබැවින්, ඉතා කඩිනමින් නව නිවාස සංකීර්ණයක් තැනීම සඳහා යෝජනා කැඳවීමක් (RFP), රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව (PPP) ක්‍රමයට සිදුකිරීම කාලෝචිත බවත්, එය කඩිනමින් සිදුකිරීම අවශ්‍ය වන බවත් නිරීක්ෂණය කරමි.

05. තවද, මෙම නිවාස සංකීර්ණයෙහි වත්මනෙහි උද්ගතව ඇති තත්ත්වය පිළිබඳව ඔබගේ කාරුණික අවධානය යොමු කරවන අතර, දැනුවත්වීම පිණිස ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවෙහි පිටපත් මේ සමග යා කර එවමි.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
දුරකථනය : 011-2695738
විද්‍යුත් තැපැල : pubab.secretary@sltnet.lk

පිටපත්

1. ජනාධිපති ලේකම්තුමා
   ජනාධිපති කාර්යාලය
   } කරු. දැන ගැනීම සඳහා

2. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
   තොරතුරු හා තාක්ෂණ අංශය
   } සමුළු නිවාස සංකීර්ණයෙහි පදිංචිකරුවන්ගේ දැන ගැනීම පිණිස වෙබ් අඩවියට ගොනුගත කිරීමට